

# කච්චායන
# ධාතු මඤ්ජූසාව.



# ධාතුමඤ්ජූසා.

මෙනම් පොත ඉතා ප්‍රසිද්ධ බැවින් කව්රුත් දනිත්.

කුරුණෑගල් නුවරකාලේදී හෝ ඊට මදක් අතීතයෙහිදී හෝ තනනලදැයි සිතියහැක්කේය—කවර හෙයින්දැයත්? යක්දෙස්සා ගල්වෙහෙර වැසි සීලවංස නම් මහාස්ථවිරකෙනෙකුන් විසින් මෙය රචනාකරණලදී. සත්කෝරළේ මේ ආදි විහාර සශ්‍රීකව තිබුණේ දඹදෙණි කුරුණෑගල කාලයේදීය.

කව්කල්පද්‍රුමය ව්‍යවහාරකළ කෙනෙක්යයි සිතිය හැක්කේය. කවරහෙයින්ද මෙහි සියලු ක්‍රමය ඊට අනුකූලයි.

කසයින්ධාතු පාඨය මිට පුරාණයි, මෙහි ඒ ධාතුපාඨය මිතක් කොටද තිබේ.

මෙහි ඛකාරාන්ත ධාතුදක්වන ගාථාදෙක කොයි පොතෙත් නොදුටුමු, ඒ ගාථාදෙක අප විසින් තනනලදී.

# Translation of the Preface.

Having saluted the Sage who has reached the furthest shore of the shoreless ocean of Grammar, I compose the Dhátumanjúsá (casket of verbal roots,) which serves as a path-way to the sacred Scriptures (of Buddha.)

Having consulted the Sacred Writings of Buddha, and the various Grammatical Works, the verbal Roots shall be treated of here, both those given in the Root Glossaries, and those that are not given (therein.)

(It will be found) that in some places to meet the exigencies of metre, the letter O is added to the terminations of verbal roots, I, and U made long, and the signification of the root placed before the root itself.

## TRANSLATION OF THE CONCLUSION.

Verbal roots, indeed have various significations. To express the sense of a verb, one signification only is generally given here, but others should be learnt according to the usage of standard writings.

This Dhátumanjúsá has been composed in alphabetical order, in correct and perspicuous language, for the benefit of the uninitiated by the learned Thero Silavanso. The learned Thero Silavanso that the chief of ecclesiastíes who was like a royal swan in the pond of sacred Writings, who longed for the firm establishment of religion, and who was the Incumbent of Yakkdehilena, composed this work.

## PREFACE TO THE SECOND EDITION.

This edition has undergone a careful revision. A few alterations and additions have been made. Since the publication of the first edition some errors, which had crept in, have been corrected with the help of the many intelligent friends, who took an interest in the success of the work. Notwithstanding the difficulties attending a task of this nature, I may state that no pains have been spared to render the work more popular, and deserving of that favor, which the public so kindly accorded to the previous edition.

An important point, as regards the date at which the author flourished still remains unsettled. But judging from a comparision of the other writings attributed to him and from certain other documents, I am led to the opinion that we may with probability fix the period to the reign of King Pandita Prakrama Bahu (A. C. 1303) who held his Court at Kurunegala.

In this edition the text has been considerably enlarged, but almost all the notes have been altered. It is hoped that the work in its present form may prove of use, not only to students but to teachers generally.

BATUVANTUDAVE.

Colombo, 14th July, 1891.

# ප්‍රාරම්භගාථා සන්නය.

"මුනිං වන්දිත්වා ධාතුමඤ්ජූසං බ්‍රූමි" යනු මෙහි ක්‍රියාකාරක පද සම්බන්ධයි: බුදුන් වැඳ ධාතුමඤ්ජූසා නම් ප්‍රකරණයක් කියමි, හෙවත් රචනා කෙරෙමි යනු අර්ථයි— කෙබඳු බුදුකෙනෙකුන් වැඳ කෙබඳු ධාතුමඤ්ජූසාවක් කියයිද යත්?— නිරුත්තිනිකර, ව්‍යාකරණ සමූහ නැමති; අපාරපාරාවාර, පරතෙර නැති සාගරයාගේ; අන්තගං, කෙළවරට ගිය, හෙවත් පරතෙරට පැමිණි; මුනිං වන්දිත්වා, මුනිහු වැඳ; පාවචනජසං, ප්‍රවචනමාගීවූ; හෙවත් ත්‍රිපිටක බුද්ධ වචනයට මගක් වැනිවූ; ධාතුමඤ්ජූසං, ධාතුමඤ්ජූසා නම් ප්‍රකරණයක්; බ්‍රූමි, කියමි.

සොගතාගමං, සුගතාගමයටද; තං තං ව්‍යාකරණානි ච, ඒ ඒ ව්‍යාකරණයන්ටද; ආගම්ම, පැමිණ හෙවත් ඒ සුගතාගමාදිය අවබෝධ කොට; පාඨෙ අපඨිතාපි'ච, ධාතුපාඨයෙහි නොකියන ලද්දාවූද, (අපි ශබ්දයෙන් එහි කියනලද්දාවූද); ධාතවත්ථා, ධාතුන් අර්ථයෝ; එත්ථ, (අප විසින්) ප්‍රස්තුත මේ මඤ්ජූසායෙහි; පවුච්චරෙ, කියනු ලැබෙති.

සුගතාගමයත් ඒ ඒ ව්‍යාකරණයනුත් දැන කසයින් ධාතු පාඨයෙහි හදළාවූත් නොහදළාවූත් ධාතූහුද අර්ථයෝද මේ මඤ්ජූසායෙහි කියනු ලැබෙති යනු භාවයි— මෙහි ඒ ඒ ව්‍යාකරණ නම්, කසයින් මුගලන් ශබ්දනීති යනාදී ශාස්ත්‍ර හා තදාශ්‍රයවූ නානාවිධ මාගධ ප්‍රකරණයන් හා පාණිනීය චාන්ද්‍රකාතන්ත්‍ර මුග්ධබෝධාදී සංස්කෘත ව්‍යාකරණයෝයි— "පාඨෙව" යනු නිතරම දකින්ට ලැබෙන නමුත් එය කාලාන්තරයෙන් වැටුනු විරුද්ධ පාඨයෙකැයි හැගේ.

ක්වචි, කිසි තැනෙක; ඡන්දඅභානිත්ථං, ඡන්දස්හානි වලකනු පිණිස; ධාත්වන්තානං, ධාතූන්ගේ අන්තයන්ට; ඔකාරං, ඔකාර දෙශද; යුත්තං දීඝො ච ඉකාර උකාරයන්ට දීර්ඝද; ධාතුමජ්ඣා පුබ්බං, ධාතුවට පූර්වයෙහි; අත්ථපදං අපි, අර්ථපදයද; සියා, වන්නේය.

6– 'අගෙගාතු ගති කොපිලෙල" යන මෙයින් ගා–57="අයො චයෙ" යනාදියෙන්"ධාත්වන්ත අකාරයට ඔකාරාදෙශත්,–34– "එදි'තු කිච්චලනෙ,,–35–"ඉදි තු පරිම්සසරියෙ" යනාදයෙන් ඉකාරයහට දීර්ඝත්,–53–"කමු තු පදවික්ඛෙපෙ බමු තු සහණෙ සියා" යනාදියෙන් උකාරයහට දීර්ඝත්,–18–"ගමතෙ අවට්ටෙ මුණ්ඩං"–83– "නිඤ්ඤයං ගරහෙ" යනාදියෙන් ධාතුන්ට මුලින් අර්ථපදත් දතයුතු.

---

මඤ්ජූසායන්නමෙතාය මජ්ඣ මඤ්ජුසයා මතං,
මනීසිනො පාවචනමෙසිනො යෙ මහෙසිනො.

# කච්චායන ධාතුමඤ්ජූසා.

**නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.**

නිරුත්තිනිකරං පාරං පාරං'නන්තගං මුනිං,
වන්දිත්වා ධාතුමඤ්ජූසං බ්‍රෑමි පාවචනඤ්ඤසං.

සොගතානම්මාගම්ම තං තං ව්‍යාකරණානි ච,
පාඨෙ චා'පසිතා'පෙත්ථ ධාතවො ච පවුච්චරෙ.

ඡන්ද'හානිට්ඨමොකාරං ධාත්වන්තානං සියා ක්වචි,
යුත්තං දීඝො ච ධාතුම්හා පුබ්බමත්ථපදං අපි.

1 භූ සත්තායං පච පාකෙ ගමු-සප්ප ගතිම්හි ච)

**ක**

සිලොක (ධාතු) සඞ්ඝාතෙ සකි සඞ්කාය (වත්තතෙ)

2 (අථො) කුක-වකො 'දානෙ කෙ සද්දෙ අකි ලක්ඛණෙ,
කු සද්දෙ කුච්ඡිතෙ ටකි බන්ධනෙ * මකි මණ්ඩනෙ.

3 වකි කොටිල්ලයාත්‍රාසු සක්ක-ටීක වයං ගතෙ,
තකි ලොලත්තනෙ යාතෙ තකී (ඉධ) ගතාදිසු.

**ඛ**

4 ඉක්ඛො (තු) දස්සනඞ්කෙසු ඛී ඛයෙ කඞ්ඛ කඞ්ඛණෙ,
චක්ඛ දස්සෙ චික්ඛ වාචෙ දික්ඛො'පනයමුණ්ඩිසු.

5 වතො'දෙසෙසු නියමෙ භක්ඛා'දනම්හි භික්ඛ (ච)
යාචෙ රක්ඛො රක්ඛණම්හි සික්ඛො විජ්ජග්ගහෙ (තථා).

**ග**

6 අග්ගො (තු) ගති කොටිල්ලෙ ලග සඞ්ගෙ වගෙ 'සනෙ,
අගී ඉගී රිගී ලිගී වගී ගත්‍යත්ථධාතවො.

**ඝ**

7 සිලාඝ කත්ථනෙ ජග්ඝ හසනෙ අග්ඝ අග්ඝනෙ,
සිඝි ආඝාණනෙ (හොති) ලඝි සොසගතීසු (ච)

**ච**

8 වච බ්‍යත්තවචෙ යාච යාචනෙ රුචි දිත්තියං,
සුච සොකෙ ඛුච ස ද්ද (අථො) විචි විවෙචනෙ.

9 අඤ්ච පූජාගතෙ වඤ්ච ගමනෙ කිඤ්චා 'වමද්දනෙ,
ලුඤ්චා 'පනයනෙ නච්ච නච්චනෙ මච රොචනෙ

10 අච්චා, චචනෙ චු චවනෙ සචො (තු) සමවායනෙ,
පච යාතෙ කචි-වච්ච දිත්තියං මචි ධාරණෙ.

---

* "මඞ්ක දූරණෙ"–මේ සැකයි.

ඡ

11 පුච්ඡ සම්පුච්ඡනෙ මුච්ඡ මොහසම්ං ලඡ ලක්ඛණෙ,
අඡා'ඝාමෙ හවෙ පුඡ පුඡනෙ උඡ උඡනෙ.

12 තචෙඡා තනුක්‍රියෙ පිඡ පිඡනෙ
ජ
රාජ දිත්තියං,
වජා 'ජ ගමනෙ රජ රාගෙ හඤ්ජා 'වමද්දනෙ.

13 අජු බ්‍යත්තිගතීකන්තිමක්ඛණෙසෙව 'ජ කම්පනෙ,
හජ සංසෙවනෙ සඤ්ජ සඞ්ගෙ (තු ඉඤ්ජ කම්පනෙ

14 යජ දෙවච්චනෙ දානසඞ්ගතීකරණෙසු (ච)
තිජක්ඛමතිසානෙසු * දානෙ'(පි) වජ හානියං.

15 සජා'ලිඞ්ගනවිස්සජ්ජනිම්මාණෙ මුජ්ජ මුජ්ජනෙ,
මජ්ජ සංසුද්ධියං ලජ්ජ ලජ්ජනෙ තජ්ජ තජ්ජනෙ.

16 අජ්ජ-සජ්ජා'ජ්ජනෙ සජ්ජ නිම්මාණෙ ගජ්ජ සද්දනෙ,
ගුජ-කුජ වයං සද්දෙ අබ්‍යත්තෙ ඛජ්ජ භක්ඛණෙ.

17 භජ්ජ පාකෙ විජී භයචලනෙ වීජ වීජනෙ,
බජී ගමනවෙකල්ලෙ ජී ජයෙ ජු ජවෙ (සියා)

ඣ

18 ඣෙ චින්තායු ජ්ඣ උස්සග්ගෙ
ට
ගමනෙ අට-පට වයං,
නට නච්ච රට පරිභාසනෙ වට වෙඨනෙ.

19 වට්ට ආවත්තනෙ වණ්ට වණ්ටත්ථෙ කට මද්දනෙ,
ඝුටො විසරණාදීසු කට සංවරණෙ ගතෙ

20 ඝුට ඝොසෙ පතිඝාතෙ චිට 'කොසෙ (ච) පෙසනෙ,
භට භත්‍යං කුට කොට්ටච්ඡෙදනෙ ලුට ලොටනෙ.

21 ජට-ඣට-පිට සඞ්ඝාතෙ චිටු'ත්තාසෙ ඝටි 'හනෙ,
ඝටි සඞ්ඝට්ටනෙ තට්ට ඡෙදනෙ මුට මද්දනෙ.

ඨ

22 පඨ බ්‍යත්තවචෙ හෙඨ බාධායං වෙඨ වෙඨනෙ,
සුඨි-කුඨි-වයං සොසෙ පීඨ හිංසනධාරණෙ.

23 කඨ සොසනපාකෙස වඨ ථූලත්තනෙ (හවෙ),
සඨි සොසෙ රුඨ-ලුඨො 'පඝාතෙ සඨ කෙතවෙ.

24 (සියා) හඨ බලක්කාරෙ
ඩ
කඩි හෙදෙ කඩිච්ඡිදෙ,
මඩ විභූසනෙ වඩ වඩ්ඩෙකො හඩි හඩනෙ

25 පඩි උප්පඩනෙ ලිඞ්ගවෙකල්ලෙ මුඩි ඛඩනෙ,
ගඩි වනෙකදෙසම්හි ගඩි සන්නිචයෙ'(පි ච)

---

* "ඛෙඩ" මෙබඳු අඩියක් නොපෙනේ.

26 රඩි-එරඩි හිංසායං පිඩි සඞ්ඝාතආදිසු,
කුඩි දාහෙ පඩි ගතෙ හිඩි ආහිඩනෙ (සියා).

27 කරඩ භාජනත්ථම්හි (අථො) ලඩි ජිගුච්ඡනෙ,
(වත්තතෙ) මෙඩි කොපිල්ලෙ සඩි ගුම්බත්ථම්රණෙ.

28 (අථො'පි) අඩි අඩ්ඪෙ (දිසතෙ) තුඩි තොඩනෙ,
ඪ වඩ්ඪ සංවඩ්ඪනෙ කඩ්ඪ කඩ්ඪනෙ
ණ භණ භාසනෙ.

29 සොණ වණ්ණෙ ගුණබ්භාසෙ ඉණ-එණ වයං ගතෙ,
පණ වොහාරථොමෙසු (වත්තතෙ) කණ මීලනෙ.

30 අණ-රණ-කණ-මුණ-ඛණ-කුණ සද්දෙ
ත
යත පතියතනෙ ජුත දිත්තිම්හි,
අත-පත ගමනෙ චිත සඤ්ඤාණෙ,
කිත වාසා'දෙ චතු චත්තුම්හි.
ථ
31 (භවෙ) කත්ථ සිලාඝායං මථ-මන්ථ විලොළනෙ,
නාථ යාචනසන්තාපඉස්සරා'සිංසනෙසු (ච).

32 පුථ (වෙ) පුථු විත්ථාරෙ බ්‍යථ භීතිචලෙසු (ච),
* ගොත්ථු වංසෙ පථ-පත්ථ ගතෙ
ද නන්ද සම්ඩියං

33 වන්ද'භිවාදථොමෙසු ගද බ්‍යත්තවචෙ'(පි ච),
(අථො) නින්ද ගරහායං ඛදි පක්ඛන්දනාදිසු.

34 එදි (තු) කිඤ්චිචලනෙ චදි කන්තිහිලාදනෙ,
කිලිදි පරිදෙවාදෙ උදි සසවකිලෙදනෙ.

35 ඉදි (තු) පරමිස්සරියෙ අදි අන්ද ච බන්ධනෙ,
භගන්ද සෙචනෙ (හොති) භද්ද කල්‍යාණකම්මනි.

36 සිද සිහාරපාකෙසු සඳු හරිතසොසනෙ,
මදි බලේ‍ය මුද-මද සන්තොසෙ මද්ද මද්දනෙ

37 සන්දු පස්සවනාදීසු කන්ද'ව්හානෙ (ච) රොදනෙ,
විද ලාභෙ දද දානෙ රුදි අස්සු විමොචනෙ.

38 සදෙ විසරණා'දානගමනෙ (චා)'වසාදනෙ,
හලාද (තු) සුඛෙ සුද කඛරණෙ රද විලෙඛණෙ

39 සාද අස්සාදනාදීසු ගද බ්‍යත්තවචෙ'(පි ච),
නද අබ්‍යත්තසද්දෙ (තු) රද'ද-ඛාද භක්ඛණෙ

---

* සකුණි මේ තුදුපිමූ

40 අද්ද යාචනයාත්‍රාදිසව' (ථො) මිද සිනෙහනෙ,
(සියා) බුද ජිඝච්ඡායං දළිද්ද දුග්ගච්චං (හි තු).

41 ද දවෙ දු ගතිවුඩ්ඪියං දා දානෙ විද ජානනෙ,
තදි ආලසියෙ
ධ
බාධ බාධායං ගුධ වෙඨනෙ *

42 (අථො) ගාධ පතිට්ඨායං වුධු-එධ (ච) වුඩ්ඪියං,
ධා (හොති) ධාරණෙ (චෙව) විඤ්ඤායං බුධ බොධනෙ.

43 සිධු ගතිම්හි සුධ සම්පහාරෙ විධ වෙධනෙ,
රාධ හිංසාය සංරාධෙ බධ-බන්ධ (ච) බන්ධනෙ.

44 ඉධ-සාධ (ච) සිද්ධිම්හි ධෙ පානෙ ඉන්ධ දිත්තියං,
න
මාන පූජාය වන-සන සම්භමෙ අන පාණනෙ,
කන දිත්ති ගතීකන්ත්‍යං බන-බනච'වදාරණෙ.

ප
45 ගුප ගොපනකෙ ගුප සංවරණෙ තප සන්තාපෙ තප ඉස්සරියෙ
චුප මන්දගතෙ තපු උබ්බෙගෙ රප-ලප වාක්‍යෙ සප අක්කොසෙ.

46 ජප-ජප්ප වචෙ'බ්‍යත්තෙ තප්ප සන්තප්පනෙ (සියා).
කපි කිඤ්චිචලෙ කප්ප සාමත්ථෙ වෙපු කම්පනෙ.

47 තප්ප සන්තානගතෙවෙජ්ජෙ තනොක හිංසාදිසු'(වචනෙ) †
වප බීජවිනික්ඛෙපෙ ධූප සන්තාපනෙ'(පි ච).

48 වප සාන්තෙව පු පවනෙ ඛප දාහෙ සුපො සයෙ.
ඵ
පුප්ඵ විකසනෙ (හොති)
බ
(රබ) ලබ 'වසංසනෙ.

49 චුබ වදනසංයොගෙ කබ සංවරණෙ (මතො),
අබ සද්දෙ (ච) අස්සාදෙ තායනෙ සබි මණ්ඩනෙ.

50 ගබ්බ දප්පෙ'බ්බ-සබ්බා'(පි) ගමනෙ පුබ්බ පූරණෙ,
ගුබ්'බ ගුබනෙ චබ්බ අදනෙ උබ්බ ධාරණෙ.

භ
51 ලභ ලාභෙ ජම්භ ගත්තවිනාමෙ සුභ සොභනෙ,
භී භයෙ රභ රාභස්සෙ (චා) රම්භ බුභ සචලෙ.

5 ථම්භ-ඛම්භ පතිබන්ධෙ ගබ්භ පාගබ්භියෙ චභ,
සුම්භ සංසුම්භනෙ සම්භ විස්සාසෙ යභ මෙථුනෙ.

53 දුභ ජිඝිංසනෙ දබ්භ ගන්ථනෙ උද්දභා'දනෙ.
ම
කමු (තු) පදවික්ඛෙපෙ ඛමු (තු) සහණෙ (සියා).

---

* “ගුධ පරිවෙඨනෙ” පාණිනීයධාතුපාඨ “රොසනෙ” යනු වද්‍යපාඨයි.

† “ගප්ප සන්තප්පණෙ තපවෙජ්ජෙ ති සාදිසු('චචනෙ)”

54 හමු'අනවඨානෙ (ච) චමු උග්ගිරණාදිසු,
ඛිලමු-කලමු ගෙලඤ්ඤෙ රමු කීළාය'(මීරිතො).

55 දමො දමෙ තම තමෙ (අථො) සම පරිස්සමෙ,
යමු උපරමෙ නාසෙ අම යාතෙ මූ බන්ධනෙ.

56 ධූමො පුමො (ච) ධම්මතෙ තම ඝඞ්ඛා විභූසනෙ,
ධූම-පීම (ච) සඞ්ඝාතෙ තම සාන්තව'වසාදියෙ.

ය

57 අයො වයො පය-මයො නයො රය ගතිම්හි (ච),
දය දානගතිරක්ඛාහිංසාදිසු යූ මිස්සනෙ.

චාය සම්පූජනෙ තය සන්තානෙ පාය වුඩ්ඪියං,
(අථො) උසූය දොසා'විකරණෙ සාය සායනෙ.

ර

58 තර තරණස්මිං ථර සත්ථරණෙ හර හරණස්මිං ථර සම්ථරණෙ,
සර ගතිචින්තාහිංසාසද්දෙ ථුර චලනාදො හර හරණස්මිං.

59 රි සන්තතිස්මිං රි ගතෙ රු සද්දෙ බුර වජ්ජිස්මිං ධර ධාරණම්හි,
ජර ජීරණත්ථෙ මර පාණචාගෙ ඛර සොසනාසෙ සර සෙවනම්හි

60 ගරො නිගරණෙ සෙකෙ දර ඩාහෙ විදාරණෙ,
චර ගති භක්ඛණෙසු වර සංවරණාදිසු.

61 ඡර චෙජ්ජෙ අර නාසෙ ගතෙ (ච) පූර පූරණෙ,
කුර'කොසෙ තර තයෙ ජාගර සුපිනක්ඛයෙ.

ල

62 පිලු-පලු-සල-හුලා ගත්‍යත්ථා චිල කම්පනෙ,
බල සචලනෙ චුල්ල විකාසෙ ජල දිත්තියං.

63 ඵල නිප්ඵත්තියං හොති දල දිත්තිවිදාරණෙ,
දල දුග්ගතියං නීල වණ්ණෙ මිල නිමීලනෙ.

64 සීල සමාධිම්හි කීල බන්ධෙ ගල-ගිලා'දනෙ,
කුල ආවරණෙ සූල රුජායං බල පාණනෙ.

65 තල-මූල පතිඨායං වල-වල්ල නිවාරණෙ,
පල්ල නින්නෙ (ච) ගමනෙ මල-මල්ල'වධාරණෙ.

66 (වත්තතෙ) ඛිල කාඨින්නෙ කලිලෙ අල-කල චයං,
වෙල්ල සචලනෙ කල්ල සජ්ජනෙ අලි බන්ධනෙ.

67 චුල්ල භාවකිරියෙ ථූලං'කාසනෙ චූල මද්දනෙ,
(වත්තතෙ) බල සොචෙය්‍ය පල රක්ඛගතෙසු (පි)

68 කෙල-ඛෙල-වෙල-පෙල-මෙල-සචලනාදිසු,

ව

අව රක්ඛණෙ ජීව පාණ ධාරණෙ (තු) පලවො ගතෙ

69 කඬුවනම්හි කඬූවො සරණෙ ඡේදනෙ දවෙ,
දෙවො (තු) දවනෙ දෙවු දෙවනෙ සෙවු සෙවනෙ.

70 ධාව ගමනවුඩ්ඪිම්හි (පසිතො) ධොවු ධොවනෙ,
වෙ–වී වෙ තන්තුසන්තානෙ වෙ–වු ස වරණෙ (සියා).

71 ඵහව අවහානෙ කෙව සෙකෙ ධුව යාත්‍රාපිරෙසු ච).

ස

72 අස–ගස අදනෙ ඝස අදනස්මිං ඉස පරියෙසෙ ඉසු ඉච්ඡායං,
සසු පාණනගතිහිංසාදූනෙව මිස ආමසනෙ මුස සම්මොසෙ.

73 කුස අක්කොසෙ දුස අප්පිතෙ තුස සන්තොසෙ පුස පොසම්හි,
රුස ආලෙපෙ * රුස හිංසායං මසු මච්ඡෙරෙ උසු දහෙ'(පි).

74 භස භසනස්මිං ඤුස සද්දස්මිං තස උබ්බෙගෙ ත්‍රස උබ්බෙගෙ,
ලස කන්ත්‍යත්ථෙ රස අස්සාදෙ (පුන) හස හසිතකරණෙ (වා'පි).

75 ගවෙස මග්ගණෙ පංස නාසනෙ දිස පෙක්ඛණෙ,
සාසා'නුසිට්ඨියං හංස පීතියං පාස බන්ධනෙ.

76 සංස පසංසනෙ ඉස්ස ඉස්සායං කාස කාසනෙ,
ධංස පධංසනෙ සිංස ඉච්ඡායං සංස සංසනෙ.

77 ඩංස–දංසා (තු) ඩසනෙ භාස වාචාය දීත්තියං,
(සියා) භූස අලඞ්කාරෙ (අථො) ආසූ'පවෙසනෙ.

78 වස කන්තිනිවාසෙසු වස්ස සෙවනසද්දනෙ,
ඝිස සාණෙ කස ගතෙ කස හිංසාවිලෙඛනෙ.

79 දිසා නිසජ්ජනාදීසු කාස දිත්තිම්හි සජ්ජනෙ,
(ද්වෙ ධාතු) ඛස–ඛස හිංසායං මිස මිලනෙ.

80 සු හිංසාකුලසන්ධානයාත්‍රාදීසු සුපස්සවෙ,
සු සද්දෙ සු පසවනෙ සි සයෙ (ච) සි සෙවනෙ.

හ

81 මහ පූජායා'රහ පූජායං ගුහ සංවරණෙ ලිහ අස්සාදෙ,
රහ වාගස්මිං මුහ මුච්ඡායං මහ සත්තායං බහු සංඛ්‍යාණෙ.

82 සහ ඛමෙ දහ භස්මීකරණෙ (ච) පතිට්ඨායං,
රුහ සජනෙ ඌහ විතක්කෙ වහ පාපණෙ.

83 දුහ'ප්පපූරණෙ නාසෙ දීහො උපචයෙ මතො,
නින්දායං ගරහො ඊහ ඝට්ටනෙ මිහ සෙචනෙ.

84 ගාහ විලොළනෙ බෲහ–බහ–බ්‍රහ (ච) වුඩ්ඪියං,
වෙහ සද්දම්හි හසනෙ හා චාගෙ
ලූළ මත්ථනෙ.

ළ

කීළ විහාරම්හි ළළ විලාසෙ'(මෙසවුඩ්ඪිකා).

---

* "සෘස ගතෞ"–පාණිනීයධාතුපාඨ.

### තුදාදයො අවුඩ්ඪිකා.

85 තුද බ්‍යථායං තු නුද ඛෙපණෙ ලිඛ ලෙඛණෙ,
කුච සංකොචනෙ රිච ඣරණෙ ඛච බන්ධනෙ *

86 උච සෙද්ද සමවායෙ විජී භය චලෙසු ච,
(වත්තනෙ) භුජ කොටිල්ලෙ වලජො තු වලජනෙ.

87 භජ සෙවා පුථක්කාරෙ රුජ රොගෙ අටා'ටනෙ,
කුට ඡෙදෙ ච කොටිල්ලෙ අගා සඞ්ඛායනාදිසු.

88 පුණො සුභක්‍රියෙ වත්ත වත්තනෙ වත යාචනෙ,
පුථ පාකෙ පූතිභාවෙ කුථ සංකෙලසනෙ පි ච.

89 (උභො ධාතු) පුථ පථ විත්ථාරෙ විද ජානනෙ,
හද උච්චාර උස්සග්ගෙ වින්තායං මිද හිංසනෙ.

90 නන්ධ විනන්ධනෙ පීන පුන සංඝාත වාචිනො,
ඣප අවජාදනෙ වප්ප වාරණෙ ඛිප පෙරණෙ.

91 සුප සයෙ ප්‍රපො එසෙස (වත්තනෙ) චප සාන්තවනෙ
නභ ධාතු විහිංසායං රුම්භ උප්පීළනාදිසු.

92 සුම්භ සංසුම්භනෙ ජම්භ ජම්භනෙ ජුභ නිවජුභෙ,
ථුභ නිට්ඨුභනෙ චමු අදනෙ ජමු ගිලනෙ.

93 ඛමු දයෙ ජමු අදනෙ ඉරිස වත්තනෙ (පිව)
කිර ධාතු විකිරණෙ ගිරෙ නිගිරණාදිසු.

94 පුර සංවලනාදිසු කුර සද්ද දනෙසු ච,
ඛුර ඡෙදෙ විලෙඛණෙ ඝුර භිමෙ ගිලා'දනෙ.

95 තිල සෙනහෙ විල වාසෙ හිල භාවෙ සිලු'ජනෙ,
ඛිල භෙදෙ ථුල වයෙ කුස ඡෙදන පූරණෙ.

96 විස පපවෙසෙ ඵරණෙ දිසා'තිසජ්ජනාදිසු,
ඵුස ඵසෙස මුස ථෙය්‍යෙ ථුස අප්පිත්‍රියාය තු,
ගුළ මොක්ඛ ගුළ පරිවත්තනම්හි (තුදා දයො)

### හු භූවාදයො ලුත්තවිකරණා.

97 හු භූ සත්තාය (මූළවන්ති) ඉ අජ්ඣායනෙ ගතිම්හි ච,
ඛා ඛ්‍යා වයං පකථනෙ ජී ජයෙ ඤු'වබොධනෙ.

98 සී ළී වෙසාසගමනෙ යා ගති විනිවුත්තියං,
ණි ධාපනෙ මුණ ඤාණෙ හන හිංසා ගතීසු පි.

99 පා රක්ඛණෙ මහි ධා ධානෙ බ්‍රූ වාචායං වියත්තීයං,
භා දිත්තියං මා පමාණෙ (අථො) යා පාපුනෙ සියා.

* ඛ ච–භූත ප්‍රාදුර්භාවෙ, පාණිනීය ධාතුපාඨයි

100 (දුවෙපි) රු ලා ආදානෙ වා ගති ගන්ධනෙසු පි,
අස ධාතු භුවි ක්ඛ්‍යාතො සි සයෙ සා සමප්පියෙ.

**ජුහොත්‍යාදයො සම්භාව ලුත්තවිකරණා**

101 හු දානෙපි ච ආදානෙ හබ්‍යදානෙ ච විත්තති,
හා චාගෙ කමු යාත්‍රායං ද දානෙ ධා ච ධාරණෙ

අ විකරණභුවාදයො සමත්තා.

**රුධාදයො.**

102 රුධි ආවරණෙ මුච මොචනෙ රිච රෙචනෙ
සිච සෙකෙ යුජ යොගෙ භුජ පාලන භොජනෙ.

103 කති ඡෙදනෙ ඡිදි ද්වෙධාකරණෙ භිද විදාරණෙ,
විද ලාභෙ ලුප ඡෙදෙ විනාසෙ ලිප ලිම්පනෙ
පිස සංචුණ්ණනෙ හිසි විහිංසායං (රුධාදයො).

**දිවාදයො.**

104 දිවු කීළා විජිගිංසා වොහාරජ්ජුති ථොමිතෙ,
සිවු තන්තුසන්තානෙ ඛි ඛයෙ ඛ්‍යා පකාසනෙ.

105 කා ගා සද්දෙපි ඝා ගන්ධොපාදානෙ රුච රොචනෙ,
කච දිත්ත්‍යම් මුච මොචෙ (අථො) විච විවෙචනෙ

106 රජ රාගෙ සජ සඟෙ බලනෙ මජ්ජ සුද්ධියං,
යුජො සමාධිම්හි ලුජො විනාසෙ ඛා විච්ඡින්නනෙ,

107 තා පාලනෙ ඡිදි ද්වෙධාකාරෙ මිද සිනෙහනෙ,
මදු'ම්මාදෙ ඛිද දීනභාවෙ භිද විදාරණෙ,

108 සිද පාකෙ පද ගතෙ විද සත්තා විච්ඡින්නනෙ,
දී ඛයෙ සුපනෙ ද ච දනෙ දූ'වබන්ධනෙ.

109 බුධා'වගමනාදිසු අත්ථෙසු යුධ යුජ්ඣනෙ,
කුධ කොපෙ සුධ සොචෙ රාධ හිංසාය සිද්ධියං.

110 ඍධ සංසිද්ධි වුද්ධිසු සිධ සාධ ච සිද්ධියං,
විධ වෙධෙ ගිධ ගෙධෙ රුධි ආවරණාදිසු.

111 මන ඤාණෙ ජනු'ප්පාදෙ හන හිංසා ගතීසුපි,
සිනා සොචෙ කුප කොපෙ තප සන්තාප පීණනෙ,

112 ලුප ඡෙදෙ රුප නාසෙ පකාසෙ දිප දිත්තියං,
දප හාසෙ ලභ ලාභෙ ලුභ ගෙධෙ ඛුභො චලෙ

113 සමු'පසම ඛෙදෙසු හර හිරි ච ලජ්ජනෙ,
මිලා ගත්ත විනාමෙ ඒ ගිලා හාසක්ඛයෙ පි ච.

114 ලී සිලෙසෙ ද්‍රවීකාරෙ වා ගති ගන්ධනෙසු ච,
ලිසි ලෙසෙ තුස තොසෙ සිලිසා'ලිඞ්ගණාදිසු.

115 කිලිස කලිසෙ පතාපෙ (අථො) තස පිපාසනෙ.
රුස රොසෙ දිස දුස අප්පිතිම්හි (දුවෙ සියුං).

116 යසුප්පයතනෙ අසු ඛෙපණෙ පිව (වත්තනෙ)
සුස සොසෙ හස අධොපාතෙ නස අදස්සනෙ

117 සා'සස්සදෙ සා'වසානෙ ච සා තනුකරණෙපි,
හා චාගෙ මුහ වෙචිත්තෙ නහ සජ්ජන බන්ධනෙ.

118 නහ සොචෙ පිහි වඤ්ඡායං සිනිහ සනිහ පීතියං.

ස්වාදයො.

119 සු සවනෙ සක සත්තිම්හි බී බයම්හි ගි සද්දනෙ,
අප සම්භු ච පාපුණනෙ හි ගතිම්හි වූ සංවරෙ.

කියාදයො.

120 කී විනිමයෙ චි චයෙ ජී ජයෙ ඤා'වබොධනෙ,
ථව'භි ත්ථවෙ කම්පනෙ ධූ (අථො) පූ පවනෙ සියා.

121 පි තප්පණෙ මා පමාණෙ බිප ඛෙපෙ මි හිංසනෙ,
මි පමාණෙ මූ බන්ධෙ ච ලූප ඡෙජ්දෙ සි බන්ධනෙ,
අස භක්ඛණෙ (අථො) ගහ උපාදනෙ (කියාදයො).

තනාදයො.

122 තනු විත්ථාරෙ සක සත්තිස්මිං දු පරිතාපෙ සනු දානස්මිං
වන යාචායං මනු බොධස්මිං හි ගතෙ අප පාපුනනස්මිං හි
කර කරණස්මිං භවති සි බන්ධෙ සු අභිස්සවනෙ (තනුආදීනි).

නිච්චං ණෙ ණය න්තා චුරාදයො.

123 චුර ථෙය්‍යෙ ලොක (ධාතු) දස්සනෙ අකි ලක්ඛණෙ,
සියා එක පතිසාතෙ (පුත) තක්ක විතක්කණෙ.

124 ලක්ඛ දස්සනඅංකෙසු වත්තතෙ මක්ඛ මක්ඛණෙ,
භක්ඛා'දනෙ මොක්ඛ මොචෙ සුඛ දුක්ඛ ච තක්‍රියෙ.

125 ලිඞ්ග චිත්තක්‍රියාදිසු මග මග්ග ගවෙසනෙ,
(පුනාපි) පථ විත්ථාරෙ කොලසෙ වච පලම්භනෙ.

126 වච්ච අජ්ඣායනෙ අච්ච පූජායං වච භාසනෙ,
රච පතියතනෙ සූච පෙසුඤ්ඤෙ රුච රොචනෙ.

127 මුච පමොචනෙ ලොච දස්සනෙ ක ච දිත්තියං,
සජ්ජා'ජ්ජ අජ්ජනෙ තජ්ජ තජ්ජනෙ වජ්ජ වජ්ජනෙ.

128 යුජ සංයමනෙ පූජ පූජායං තිජ තෙජනෙ,
පජ මග්ග සංවරණෙ ගතෙ භජ විභාජනෙ.

129 (අථො) භාජ පුථක්කාරෙ සභාජ පීති දස්සනෙ,
(අථොතු) ඝට ඝංඝාතෙ ඝට්ට සචලනාදිසු.

130 කුට කොට්ට ච්ඡෙදනෙ ච කුට අක්කොසනාදිසු,
නට නච්ච වට පුට භෙදෙ වණ්ට විභාජනෙ.

131 තුවට්ට එකසෙය්‍යනෙ සඨො විසරණෙ සියා,
ගුණ්ඨ ඔගුණ්ඨනෙ හෙඨ බාධායං වෙඨ වෙඨනෙ,
ගුඩි වෙඨෙ කඩි ඛඩි භෙදනෙ මඩි භූසනෙ

132 පඩ හඩ පරිභාසෙ දඩි ආණාය (මිරිතො),
තඩි සංතාළනෙ පිඩ සංඝාතෙ ජඩ්ඩ ජඩ්ඩනෙ.

133 වණ්ණ සංවණ්ණනෙ චුණ්ණ චුණ්ණනෙ ආණ පෙසනෙ.
ගණ සංකලනෙ කණ්ණ සවණෙ චින්ත චින්තනෙ.

134 සන්ත සං·කාවනෙ මන්ත ගුත්තභාසන ජානනෙ,
චිත සචෙතනාදීසු කිත්ත සංසද්දනෙ භවෙ.

135 යත නීය්‍යාතනෙ ගන්ථ සන්දබ්භ අත්ථ යාචනෙ,
කථ වාක්‍යප්පබන්ධෙච විද ඤාණෙ තුදෙ චුද.

136 ඡද'පවාරණෙ ඡද්ද වමනෙ ඡන්ද ඉච්ඡායං,
වදි'භිවාද ථොමෙසු හදි කල්‍යාණකම්මනි.

137 හිලාද තු සුඛෙ ගන්ධ සූචනෙ විධ කම්පනෙ,
රන්ධ පාකෙ (අථො) මාන පූජායං නු ඤුතිමහි තු.

138 ථන දෙව සද්දෙ ඌන පරිහාණෙ ථෙන චොරියෙ,
ධන සද්දෙ ඤප තොස තිසාන මාරණාදීසු.

139 ලප වාක්‍යෙ ඛිප දූහෙ රූප රොපණාදිසු,
පි තප්පණෙ සියා කප්ප විතක්කෙ ලභි වචනෙ.

140 (අථො) වති ගරහායං සමු සාන්ත්වන දස්සනෙ,
කමු ඉච්ඡාය කන්තමහි සියා ථොම සිලාඝනෙ.

141 තිමු තෙමන සංකාසු අම රොග ගතාදිසු,
සංගාම යුද්ධෙ වනෙනය්‍ය ඊර වාචා පකම්පනෙ.

142 වර ආවරණිච්ඡාසු යාචායං ධර ධාරණෙ,
තීර කම්මසමත්තිමහි පාර සමත්ථියාදිසු.

143 තුලු'ම්මානෙ බල සොවෙ සමයෙ පල රක්ඛණෙ,
කල සංකලනාදීසු හවෙ මීල නිමීලනෙ.

144 සීලු'පධාරණේ මූල රෙහණේ ලල ඉච්ඡනෙ,
දූල උක්ඛෙපණේ පූල මහත්තන සමුස්සයෙ

145 ඣුස සද්දෙ පිස පෙසෙ භූසා' ලංකාරණේ සියා,
රුස පාරුසියෙ බුංස අක්කොසෙ පුස පොසනෙ.

146 දිස උච්චාරණාදීසු වස අච්ඡාදනෙ සියා
රස'ස්සාදෙ රවෙ සෙනහෙ (අථො) සිස විසෙසනෙ.

147 සී බන්ධෙ මිස්ස සම්මිස්සෙ කුහ විම්හාපණේ සියා,
රහ චාගෙ ගතෙචාපි මහ පූජාය' මිරිතො.

148 පිහි'ච්ඡායං සියා වීළ ලජ්ජාය එල චාලනෙ,
හීළ ගාරහියෙ පීළ බාධායං තළ තාළනෙ,
ලළ ධාතූපසෙවායං (වත්තන්තී'මෙ) චූරාදයො.

**සමත්තා සත්තගණා.**

භූවාදිච රුධාදී ස්වාදයො ගණා,
කියාදී ච තනාදී ච චුරාදීතී'ධ සත්තධා.

ඉධ, මේ කසයින් ව්‍යාකරණයෙහි; භූවාදි ච, භූආදිය; රුධ දී ච, රුධිආදිය; දිවාදි, දිවුආදිය; ස්වාදයො, සු ආදිය; කියා දී ච, කී ආදිය; තනාදී ච, තනුආදිය; චුරාදී ඉති, චුරආදි යයි; ගණා, ධාතුගණයෝ; සත්තධා, සත්වැදෑරුම් වෙති.

ක්‍රියා වාචිත්ත මක්ඛාතු'මෙකෙකත්ථො බහු'දිතො
පයොගතො නුගන්තබ්බා අනෙකත්ථා හි ධාතවො.

ධාතවො, ධාතූහු; අනෙකත්ථා හි, නානා අර්ථ ඇත්තාමැයි; ක්‍රියාවාචිත්තං අක්ඛාතුං, ක්‍රියාවාචිබැව් කියන්ට; බහු, බොහෝ සේම; එකෙකත්ථොඋදිතො, එකෙකීඅර්ථය කියනලද්දේය; පයො ගතො, තෙවළා බුදුවදනින් හා ඒ ඒ ඇදුරන් පවුරුණෙන්; අනු ගන්තබ්බා, අනුව යායුතුවෙති දතයුත්තාහ.

හිතාය මන්දබුද්ධීනං ව්‍යත්තං වණ්ණක්කමා ලහුං,
රචිතා ධාතුමඤ්ජුසා සීලවංසෙන ධීමතා.

ධීමතා, ප්‍රාඥවූ; සීලවංසෙන, සීලවංසනමවූ තෙරහු විසින්; වණ්ණක්කමා, කකාරාදි අක්ෂරමාලාක්‍රමයෙන්; ව්‍යත්තං, ව්‍යක්ත කොට; ලහුං, (විස්තරක්‍රමය හළුහෙයින්ද ගාථාබන්ධ බැවින්ද ග්‍රහණධාරණසුකර බැවින්) සැහැල්ලුකොට; ධාතුමඤ්ජුසා, ධාතු මඤ්ජුසා නම්වූ ප්‍රකරණීතොම; මන්දබුද්ධීනං, හිතාය, අල්පබුද්ධීන්ට හිත පිණිස; රචිතා, රචනාකරණලද්දීය.

සද්ධම්ම පඞ්කෙරුහ රාජහංසො
ආසිණ්ණ ධම්මට්ඨිති සීලවංසො
යක්ඛද්දිලෙනාක්ඛ්‍ය නිවාසවාසී
යතිස්සරො සොයමිදං අකාසි.

සද්ධම්ම පඞ්කෙරුහ, සදහම් නැමති පියුමට; රාජහංසො, හස් රජෙක් බඳුවූ; ආසීණ්ණධම්මට්ඨිති, පතනලද ධර්‍මස්ථිති ඇති හෙවත් සද්ධර්‍මයාගේ බොහෝකල් පැවැත්ම පතන්නාවූ; සීලවංසො, සීලවංශ නම්වූ; යක්ඛද්දිලෙනාක්ඛ්‍යනිවාසවාසී, යක්ඛද්ධිලෙන වෙහෙර හෙවත් යක්ගිරිලෙන් වෙහෙර වසන්නාවූ සො අයං යතිස්සරො, හේ මේ ශ්‍රමණ නායකතෙමේ; ඉදං, මේ ප්‍රකරණය; අකාසි, කෙළේයි.

**කච්චායන ධාතුමඤ්ජූසා සමත්තා.**

# ALPHABETICAL LIST.

භූ 2 අකි-ලක්ඛණෙ, සලකුණුකිරීමෙහි—To mark.

චු 123 අකි-ලක්ඛණෙ, සලකුණුකිරීමෙහි—To mark.

තු 87 අගා-සජ්ඣායනාදිසු, හැදෑරීම් ආදියෙහි-ආදි ශබ්දයෙන් මන්ත්‍ර පිරවීම් ගතයුතු.
To read, &c-To mutter charms.

භූ 6 අගි-ගමනෙ, යාමෙහි—To go.

භූ 6 අගඝ-ගතිකොටිල්ලෙ, වක්ව යාමෙහි.
To go tortuously.

භූ 7 අගඝ-අගඝනෙ, ඇගිමෙහි හෙවත් මිලවැඩීමෙහි.
To value.

භූ 10 අච්ච-අච්චනෙ, පිදීමෙහි—To worship.

චු 126 අච්ච-පූජායං, පිදීමෙහි—To worship.

භූ 12 අජ-ගමනෙ, යාමෙහි—To go.

භූ 16 අජ්ජ-අජ්ජනෙ, සැදීමෙහි හෙවත් සැපයීමෙහි.
To decorate, To acquire.

චු 127 අජ්ජ-අජ්ජනෙ, සැදීමෙහි හෙවත් සැපයීමෙහි.
To acquire.

භූ 9 අච-පූජාගතෙ, පිදීමෙහි යාමෙහි—To honor, To go.

භූ 11 අඡ-ආයාමෙ, ඇදීමෙහි.
To pull e. g. to pull a turner's wheel (to extend)

භූ 13 අඤ්ජු-බ්‍යත්ති ගති කන්ති මක්ඛණෙසු, ප්‍රකාශකිරීමය යාමය බැබලීමය ගෑමය යන මෙහි.
To reveal (manifest) to go, to shine, to anoint.

භූ 18 අට-ගමනෙ, යාමෙහි—To go.

තු 87 අට-අටනෙ, යාමෙහි—To go.

භූ 30 අණ-සද්දෙ, ශබ්දකිරීමෙහි—To sound.

භූ 28 අඩි අඩතෙථ, අඩසඛ්‍යාත ලිඟානීයෙහි.
(To produce or try) e. g. semen genitale.

භූ 30 අත-ගමනෙ, යාමෙහි-To go.

චු 135 අත්ථ-යාචනෙ, ඉල්වීමෙහි-To ask.

භූ 39 අද-භක්ඛණෙ, කෑමෙහි-To eat or devour.

භූ 35 අදි-බන්ධනෙ, බැඳීමෙහි-To bind, To imprison.

භූ 40 අද්ද-යාචන යාත්‍රාදිසු, ඉල්වීමෙහි ගමන් ආදියෙහි-
ආදිශබ්දයෙන් පීඩාගතයුතු.
To ask, to go—To injure or hurt &c.

භූ 44 අන-පාණනෙ, ජීවත්වීමෙහි-To breathe, to live.

භූ 35 අන්ද-බන්ධනෙ, බැඳීමෙහි-To bound.

සු 119 අප-පාපුණනෙ, පැමිණීමෙහි.
To reach, To gain, obtain.

ත 122 අප-පාපුණසම්ං, පැමිණීමෙහි.
To reach, To gain, obtain.

භූ 50 අබ්බ-ගුම්බනෙ, මල්දම්සෙයින් ගෙතීමෙහි, මුවහ
කිරීමෙහි.
(Probably) To string like a garland, or to screen.

භූ 50 අබ්බ-ගමනෙ, යාමෙහි—To go.

භූ 55 අම-ගමනෙ, ගමන්හි—To go.

චු 142 අම-රොග ගත්‍යාදිසු, රෝගයෙහි යාම් ආදියෙහි-
ආදි ශබ්දයෙන් භජනය ගතයුතු.
To be sick, To go—To serve.

භූ 49 අම්බ-සද්දෙ අස්සාදෙ තායනෙ, ශබ්දයෙහි ආස්වාද
යෙහි රැකීමෙහි-To sound, To taste, To protect.

භූ 57 අය-ගතිමහි, යාමෙහි—To go, To increase,

භූ 61 අර-නාසෙ ගතෙ, නැසීමෙහි ගමන්හි.
To destroy, To move.

භූ 81 අරහ-පූජායං, පිදීමෙහි—To revere.

භූ 66 අල-කලිලෙ, සැරසීමෙහි හෙවත් හැකිබැව්හි.
නැවැත්වීමෙහි—To adorn, To be able, or to prevent.

භූ 66 අලි-බන්ධනෙ, බැඳීමෙහි-To bind, To edify.

භූ 8 අව-රක්ඛණෙ, රැකීමෙහි—To protect.

භූ 72 අස-අදනෙ, අනුභවයෙහි—To eat.

භූ 100 අස-භුවි, වීමෙහි—To be.

කි 121 අස-භක්ඛණෙ අනුභවයෙහි-To swallow.

දි 116 අස-උක්ඛෙපණෙ, දැමීමෙහි හෙවත් ඉවත්කිරීමෙහි
To throw away or to lay aside.

චු 138 ආණ-පෙසනෙ, මෙහෙයීමෙහි
To urge, to guide, to command.

 භූ 77 ආස–උපවෙසනෙ, හිඳීමෙහි—To sit.

සු 97 ඉ–අජ්ඣායනෙ ගතිමහි, හැදෑරීමෙහි යාමෙහි.
To study, To go.

භූ 4 ඉක්ඛ–දස්සනංකෙසු, දැක්මෙහි සලකුණුකිරීමෙහි.
To see, To mark.

භූ 6 ඉගි–ගමනෙ, යාමෙහි—To go.

භූ 13 ඉජ–කම්පනෙ, කම්පාවෙහි—To quake, To shake.

භූ 29 ඉණ–ගතෙ, යාමෙහි—To go.

භූ 35 ඉදි–පරමිස්සරියෙ, උතුම් ඉසුරෙහි.
To have supreme power and superhuman faculties.

භූ 44 ඉධ–සිඞ්මහි, සිඞකිරීමෙහි—To flourish.

දි 110 ඉධ–සංසිඞ්වුඩ්සු, නිපදවීමෙහි වැඩීමෙහි.
To prosper, To increase.

භූ 44 ඉන්ධ–දිත්තියං, බැබලීමෙහි—To shine.

තු 93 ඉරිය–වත්තනෙ, පැවැත්මෙහි—To exist, To live.

භූ 72 ඉස–පරියෙසෙ, සෙවීමෙහි—To search.

භූ 72 ඉසු–ඉච්ඡායං, කැමතිවීමෙහි—To wish.

භූ 76 ඉස්ස–ඉස්සායං, ඊර්ෂ්‍යාවෙහි හෙවත් නොඉවසීමෙහි.
To envy, To be impatient.

චු 141 ඊර–වාචා පකම්පනෙ, කීමෙහි කම්පාවෙහි.
To talk, To shake.

භූ 83 ඊහ–ඝට්ටනෙ–උත්සාහයෙහි—To endeavour.

තු 86 උච–සද්දෙ සමවායෙ, ශබ්දකිරීමෙහි රැස්වීමෙහි.
To sound, To be gathered together.

භූ 8 උජ්ඣ–උස්සග්ගෙ, හැරීමෙහි හෙවත් දෑමීමෙහි.
To quit, To abandon.

භූ 11 උඡ–උඡනෙ, ඇවිලීමෙහි, සිඟීමෙහි.
To glean, To pick up.

භූ 34 උදි–සව කිලෙදනෙ, වැගිරීමෙහි තෙත්වීමෙහි.
To ooze or flow, To wet.

භූ 53 උදුහ–අදනෙ, කෑමෙහි—To eat.

භූ 50 උබ්බ–ධාරණෙ, දැරීමෙහි—To bear.

භූ 73 උසු–දහෙ, දැවීමෙහි—To burn.

භූ 57 උසූය–දොසාවිකරණෙ, දොස් පලකිරීමෙහි.
To detract from.

චු 138 ඌන-පරිහාණේ, පිරිහීමෙහි.
To diminish, To deduct.

භූ 82 ඌහ-විතක්කෙ, කල්පනා කිරීමෙහි.
To consider, To reason.

භූ 13 එජ-කම්පනෙ, සැලීමෙහි—To tremble.

භූ 42 එධ-වුඩ්ඪියං, වැඩීමෙහි –To increase.

භූ 26 එරඩි-හිංසායං, හිංසායෙහි.
To oppress or injure.

භූ 3 කකි-ලොලත්තනෙ යානෙ, ඇලලීමෙහි යාමෙහි.
To churn, to move.

භූ 4 කඞ්ඛ-කඞ්ඛණේ, සැකකිරීමෙහි. කැමතිවීමෙහි.
To doubt, to desire.

දි 105 කච-දිත්තියං, බැබලීමෙහි—To shine.

චු 127 කච-දිත්තියං, බැබලීමෙහි—To shine.

භූ 10 කච-දිත්තියං, බැබලීමෙහි—To shine.

භූ 19 කට-මද්දනෙ, මැඩීමෙහි—To suppress.

භූ 19 කට-සංවරණේ ගතෙ, ආවරණයෙහි, යාමෙහි.
To cover or screen, To move.

භූ 23 කඨ-සොසන පාකෙසු, වියලීමෙහි, පිසීමෙහි.
To dry, To boil.

භූ 23 කඨි-සොසෙ, වියලීමෙහි—To dry.

භූ 24 කඩි-භෙදෙ, බිඳීමෙහි—To break.

භූ 28 කඩ්ඪ-කඩ්ඪණේ, ඇදීමෙහි—To drag.

භූ 29 කණ-මීලනෙ, ඇස නොදල්වීමෙහි—To wink.

භූ 30 කණ-සද්දෙ, ශබ්දයෙහි—To sound.

චු 131 කඩි-භෙදනෙ, බිඳීමෙහි හෙවත් කැඩීමෙහි.
To break, As to remove the pulp.

භූ 69 කණ්ඩුව-කණ්ඩුවන සරණ ඡෙදන ද්‍රවෙසු, කැසුමෙහි හිංසායෙහි, සිඳීමෙහි, ද්‍රවබැවිහි.
To scratch, To injure, cut, Liquify.

චු 133 කණ්ණ-සවණේ, ඇසීමෙහි—To hear.

රු 103 කති-ඡෙදෙ, සිඳීමෙහි—To cut.

භූ 31 කත්ථ-සිලාඝායං, ගුණයෙන් උසස්කිරීමෙහි.
To eulogize.

චු 135 කථ-වාක්‍යප්පබන්ධෙ, වචනප්‍රබන්ධයෙහි හෙවත් කථාකිරීමෙහි.
To compose, To narrate.

භූ 44 කන-දිත්‍ති ගති කන්තාසං, බැබලීමෙහි, යාමෙහි, කැමතිවීමෙහි—To shine, To go, To wish.

භූ 37 කන්‍ද-අව්හාන රොදනෙසු, ආමන්ත්‍රණයෙහි, හැඬීමෙහි—To call, To cry or weep.

තු 90 කප-අච්ඡාදනෙ, වැසීමෙහි හෙවත් ඇදීමෙහි,
To cover, or to dress.

භූ 46 කපි-කිඤ්චිචලනෙ, මඳක්සැලීමෙහි.
To tremble slightly.

භූ 49 කප්ප-සාමත්‍ථෙ, පොහොසත්බැව්හි—To be able.

චු 139 කප්ප-චින්තනෙ, තැකීමෙහි හෙවත් කල්පනාකිරීමෙහි
To consider, To think.

භූ 53 කමු-පදවික්ඛෙපෙ, පය නගා යාමෙහි.
To walk, To go, To step.

ජු 101 කමු-යාත්‍රායං, යාමෙහි—To walk or go.

චු 140 කමු ඉච්ඡාය කන්තිමහි, කැමතිවීමෙහි, කාන්තියෙහි.
To wish, To shine.

භූ 49 කම්බ-සංවරණෙ, වැසීමෙහි—To cover.

තු 122 කර-කරණස්මිං, කිරීමෙහි—To make.

භූ 27 කරණ්ඩ-භාජනත්‍ථමහි, බඳුන් අර්‍ථයෙහි,
To make a casket.

භූ 54 කලමු ගිලානෙ, ගිලන්බැව්හි-To be weak or faint

භූ 66 කල-කලිලෙ සැරසීමෙහි හෙවත් හැකිබැව්හි නොහොත් නැවැත්මෙහි.
To adorn, or to be able, To prevent.

චු 143 කල සංකලනාදීසු-ගිණීම් ආදියෙහි, ආදිශබ්දයෙන් ක්‍ෂෙපාදියගතයුතු-To count, etc—To throw or add.

භූ 66 කල්ල-සජ්ජනෙ, සැරසීමෙහි නොහොත් රොග මුක්තියෙහි—To adorn, to recover from sickness.

භූ 78 කස-ගතෙ, යාමෙහි—To go.

භූ 78 කස-හිංසා විලෙඛණෙ, පෙළීමෙහි, ඉරිඇදීමෙහි, සෑමෙහි—To oppress, to draw lines, to plough.

භූ 76 කසස-කසසණෙ, සෑමෙහි—To plough.
දි 105 කා-සද්දෙ, ශබ්දකිරීමෙහි—To sound.
භූ 79 කාස-දිත්තිමහි සජ්ජනෙ, බැබලීමෙහි, සෑදීමෙහි.
To shine, To prepare.
භූ 9 කිඤ්ච අවමද්දනෙ, මැඩීමෙහි—To bruise.
භූ 30 කිත-වාසාදෙ, විසීම් ආදියෙහි-ආදිශබ්දයෙන් රොගාපනයන සංසයාදිය දතයුතු.
To dwell,-To heal To doubt.
චු 134 කිත්ත-සංසද්දනෙ, මොනවට කීමෙහි.
To praise, To commend.
තු 93 කිර-විකිරණෙ, විසිරීමෙහි—To scatter.
භූ 54 කිලමු=කලමු-ගිලානෙ, ගිලන්වීමෙහි.
To be weak or faint.
භූ 34 කිලිදි-පරිදෙවාදෙ, විලාපබසින් හැඬීම්ආදියෙහි ආදිශබ්දයෙන් ආර්ද්‍රභාවාදිය ගතයුතු.
To lament---To become wet etc.
දි 115 කිලිස-උපතාපෙ, තැවීමෙහි-To be distressed.
භූ 78 කිස-සානෙ, තුනීකිරීමෙහි නොහොත් සනගෑමෙහි.
To make thin, Or to whet.
කි 120 කී-විනිමයෙ, ද්‍රව්‍යගණුදෙනු කිරීමෙහි.
To buy, To exchange.
භූ 64 කීල-බන්ධෙ, බැදීමෙහි—To bind, To wedge.
භූ 84 කීළ-විහාරෙ, කෙළිමෙහි To play, To line.
භූ 2 කු-සද්දෙ කුච්ඡිතෙ, ශබ්දකිරීමෙහි, කුත්සිතයෙහි.
To sound, To contemn.
භූ 2 කුක-ආදානෙ, ගැනීමෙහි-To take, To accept.
භූ 8 කුච-සද්දෙ, ශබ්දකිරීමෙහි-To sound.
තු 85 කුච-සංකොචනෙ, හැකිලීමෙහි.
To straiten, To narrow or to contract.
භූ 20 කුට-ඡෙදනෙ, කැපීමෙහි-To cut.
තු 87 කුට-ඡෙදකොටිල්ලෙසු, කැපීමෙහි, කුටිලත්‍වයෙහි.
To cut, To make crooked.
චු 130 කුට-ඡෙදනෙ, සිදීමෙහි හෙවත් කෙටීමෙහි-To cut.

චු 130 ංකුට-ආකොටනාදිසු කෙටිමෙහි හෙවත් ගැසීමෙහි ආදිශබ්දයෙන් ප්‍රතාපනාදිය ගතයුතු.
To be stopped, or obstructed-To be prevented from moving.

භූ 22 කුඨි-සොසෙ, වියලීමෙහි-To dry.

භූ 26 කුඩි-දහෙ, දැවීමෙහි-To burn.

භූ 30 කුණ-සද්දෙ, ශබ්දකිරීමෙහි-To sound.

තු 88 කුථ-සංකෙලසනෙ, දුක්ඛිතබැව්හි.
To be distressed, putrefy.

දි 109 කුධ-කොපෙ, කිපීමෙහි.
To be wrathful, To be flushed with anger.

දි 111 කුප-කොපෙ, කිපීමෙහි-To be angry.

භූ 61 කුර-අක්කොසෙ, බැණීමෙහි.
To censure, to curse.

තු 94 කුර-සද්දදනෙසු ශබ්දයෙහි, කෑමෙහි.
To sound, To eat.

භූ 73 කුස-අක්කොසෙ, නපුරුකොට බිණීමෙහි.
To censure, to curse.

තු 95 කුස-ඡෙදනපූරණෙ, සිඳීමෙහි, පිරීමෙහි.
To cut, to fill.

චු 147 කුහ-විම්හාපනෙ, විසමපත්කිරීමෙහි.
To excite wonder.

භූ 16 කූජ-අව්‍යත්තසද්දෙ, නොවියත් හඬෙහි.
To coo, To sound inarticulately.

භූ 64 කුල-ආවරණෙ, වැලකීමෙහි—To enclose.

භූ 2 කෙ-සද්දෙ, ශබ්දකිරීමෙහි-To sound.

භූ 68 කෙල-සංචලනාදිසු, සැලීම් ආදියෙහි-ආදිශබ්ද යෙන් ගමන් ගතයුතු—To shake,-To go or move.

භූ 71 කෙව-සෙකෙ, තෙම්මෙහි නොහොත් ඉසීමෙහි.
To wet or sprinkle.

භූ 20 කොට්ට-ඡෙදනෙ, කැපීමෙහි හෙවත් කැඩීමෙහි.
To cut, To break.

චු 130 කොට්ට-ඡෙදනෙ, කෙටීමෙහි හෙවත් කැපීමෙහි.
To cut, To pound.

භූ 30 ඣණ-සද්දෙ, ශබ්දකිරීමෙහි.
To sound in general or musically.

භූ 17 ඛජ-ගමනවෙකල්ලෙ, ගමන්විකලත්වයෙහි නොහොත් කොරගසායාමෙහි—To lame.

භූ 16 ඛජ්ජ-භක්ඛණෙ, කෑමෙහි.
To eat cakes &c. sometimes like a goblin.

භූ 24 ඛඩි-ඡිදෙ, බිඳීමෙහි නොහොත් කැඩීමෙහි.
To break.

චු 131 ඛඩි-භෙදනෙ-බිඳීමෙහි—To break.

චු 131 ඛදි-පක්ඛන්දනාදීසු, පැනීම් ආදියෙහි-ආදිශබ්ද යෙන් ආපල වොඩ්ඪති ගමන සොසනසෙවදනද්‍ද ගතයුතු.
To gush out &c—To flow, To go, To jump to dry, To sweat.

භූ 44 ඛන-අවදාරණෙ, කැණීමෙහි—To dig.

භූ 44 ඛනු-අවදාරණෙ, කැණීමෙහි-To dig.

භූ 53 ඛමු-සහණෙ, ඉවසීමෙහි—To bear or endure.

භූ 52 ඛම්භ-පතිබන්ධෙ, තදවීමෙහි නොහොත් ඔබාමැඩි මෙහි—To impede

භූ 59 ඛර-සෙකනාසෙ, තෙම්මෙහි, නැසීමෙහි.
To drop or let fall, To destroy.

භූ 62 ඛල-සංචලනෙ, සැලීමෙහි—To shake, To wash, &c.

ස 67 ඛල-සොචෙය්‍ය, පවිත්‍රබැව්හි—To purify.

චු 143 ඛල-සොචෙ සංචයෙ, සුචියෙහි රැස්කිරීමෙහි.
To clean, To collect.

භූ 79 ඛස-හිංසායං, හිංසායෙහි—To injure.

රු 97 ඛා-පකථනෙ, කීමෙහි-To relate.

දි 104 ඛා-පකාසනෙ, ප්‍රකාශකිරීමෙහි.
To manifest, to publish.

භූ 39 ඛාද-භක්ඛණෙ, කෑමෙහි.
To eat cakes &c sometimes like a goblin.

දි 107 ඛිද-දීනභාවෙ, බැගෑපත්බැව්හි—To be distressed.

තු 90 ඛිප පෙරණේ, යැවීමෙහි.
To Throw or cast, To direct.

කි 121 ඛිප-ඛෙපෙ, දැමීමෙහි නොහොත් දුරුකිරීමෙහි.
To cast or throw away.

භූ 66 ඛිල-කාඨිනෙන, තදබැව්හි.
To be hard, To disobey.

භූ 4 ඛි-ඛයෙ, ක්ෂයවීමෙහි නොහොත් ගෙවීමෙහි–To wane.

දි 104 ඛී-ඛයෙ, ගෙවීමෙහි—To wane.

ස 119 ඛී-ඛයමහි, ගෙවීමෙහි—To injure or kill.

භූ 40 ඛුද-ජිඝච්ඡායං, කුසගින්නවිමෙහි—To be hungry.

භූ 51 ඛුභ-සංචලෙ, ඇලලීමෙහි.
To be confused, or agitated.

දි 112 ඛුභ-චලෙ, ඇලලීමෙහි—To be confused or agitated.

භූ 59 ඛුර-ඡිදසම්ං, සිඳීමෙහි—To cut.

තු 94 ඛුර-ඡෙදෙ විලෙඛණේ, කැපීමෙහි, ඉරීමෙහි
නොහොත් ඉරිගැසීමෙහි–To cut, To scratch.

චු 105 ඛුංස-අක්කොසෙ, බැණීමෙහි.
To censure, to curse.

භූ 68 ඛෙල-සංචලනාදීසු, සැලීම්ආදියෙහි ආදිශබ්දයෙන්
ගමන්ගතයුතු–To shake &c. To tremble, To move.

චු 97 ඛ්‍යා පකථනෙ, කීමෙහි—To relate.

භූ 16 ගජ්ජ-සද්දනෙ, ශබ්දකිරීමෙහි.
To sound like thunder, to roar (lion,) to use harsh speech.

භූ 25 ගඩි-වදනෙකදෙසමහි, මුහුණේ එක්දෙසෙක්හි.
To affect the cheek-The cheek.

භූ 25 ගඩි-සන්නිචයෙ, රැස්කිරීමෙහි.
To collect (The blood as for a boil.)

චු 133 ගණ-සංකලනෙ, ගිණීමෙහි.
To count To calculate.

භූ 33 ගද-ව්‍යත්තවචෙ, ව්‍යත්බස්කීමෙහි.
To speak eloquently.

චු 135 ගන්ථ-සන්දබෙහ, ගෙතීමෙහි—To arrange.

චු 137 ගන්ධ-සූචනෙ, ප්‍රකාශකිරීමෙහි.
To publish, to arrange.

භූ 50 ගබ්බ–දප්පෙ, එඩියෙහි නොහොත් අබිමන්හි.
To be proud or haughty.

භූ 52 ගබ්භ–පාගබ්භියෙ වධෙ, ප්‍රගල්භයෙහි නොහොත් බුහුටිබැව්හි, වධයෙහි.
To be bold or confident, to injure.

භූ 1 ගමු–ගතිමහි, යාමෙහි—To go.

භූ 60 ගර නිගරණෙ සෙකෙ, වැගිරීමෙහි, තෙමීමෙහි.
To drop, to let fall.

භූ 83 ගරහ–නින්‍දායං, නින්‍දාකිරීමෙහි—To contemn.

භූ 64 ගල–අදනෙ, කෑමෙහි—To devour, to eat.

භූ 75 ගවෙස–මග්ගණෙ, සෙවීමෙහි—To search.

භූ 72 ගස–අදනෙ, කෑමෙහි—To eat.

කී 121 ගහ–උපාදානෙ, ගැන්මෙහි—To take.

දී 105 ගා–සද්දෙ, අඩකිරීමෙහි—To sound or to sing.

භූ 42 ගාධ–පතිඨායං, පිහිටීමෙහි—To stand, to remain.

භූ 84 ගාහ–විලොළනෙ, ඇලලීමෙහි—To churn, to stir.

සු 119 ගි–සද්දනෙ, ශබ්දකිරීමෙහි—To sound or sing.

දී 110 ගිධ–ගෙධෙ, ගිජුවීමෙහි නොහොත් පැතීමෙහි.
To be greedy or to desire.

තු 93 ගිර–නිගිරණාදිසු, කීම් ආදියෙහි-ආදිශබ්දයෙන් විඥාපනය ශබ්දය යනාදි ගතයුතු.
To speak &c-To cause to understand, to sing.

භූ 64 ගිල–අදනෙ, කෑමෙහි-To devour, To eat.

තු 94 ගිල–අදනෙ, කෑමෙහි-To devour, To eat.

දී 113 ගිලා–හාසක්ඛයෙ, සතුටුගෙවීමෙහි නොහොත් මිරිකීමෙහි.
To be languid or weary.

භූ 16 ගුජ–අව්‍යත්තසද්දෙ, නොවියත් අඬෙහි.
To sound inarticulately as bees &c.

චු 131 ගුඩි–වෙඨෙ, වෙළීමෙහි—To surround, to wrap.

භූ 29 ගුණ–අභ්‍යාසෙ, පුරුදුකිරීමෙහි.
To train, To practise.

චු 131 ගුණ්ඨ–ඔගුණ්ඨනෙ, වෙළීමෙහි.
To surround, To cover the head with a cloth.

භූ 41 ගුඨ-වෙඨනෙ, වෙළිමෙහි.
To bind or en-wrap.

භූ 45 ගුප-ගොපනෙ, රකිමෙහි—To guard or protect,

භූ 45 ගුප-සංවරණෙ, වැසීමෙහි —To conceal, to hide.

භූ 50 ගුම්භ-ගුම්භනෙ, මල්දම්සෙයින් ගෙතීමෙහි හෙවත් මුවහකිරීමෙහි නොහොත් ක්‍රියාවෙහි.
To string together, Likewise to screen, or to act.

භූ 81 ගුහ-සංවරණෙ, වැසීමෙහි-To conceal or hide.

තු 96 ගුළ-පරිවත්තනෙ, පෙරලීමෙහි නොහොත් වටකිරීමෙහි—To surround, to roll.

තු 96 ගුළ-මොක්ඛ-මිදීමෙහි-වෙෂ්ටනරක්‍ෂණචූණ්ණනාදියෙහි දතයුතු.
To release, to deliver, to wrap, to protect, to grind.

භූ 32 ගොත්‍ර-වංසෙ, වංසයෙහි.
To found a family, to propagate or perpetuate a race.

භූ 21 ඝට-ඊහනෙ, උත්සාහකිරීමෙහි-To endeavour.

චු 131 ඝට-විසරණෙ, හිංසායෙහි-To injure.

චු 129 ඝට-සංඝාතෙ, ගැටීමෙහි නොහොත් රැස්වීමෙහි.
To strike, to collect.

භූ 21 ඝට-සංඝට්ටනෙ, ගැටීමෙහි.
To rub or strike together.

චු 129 ඝට්ට-සංචලනාදිසු, සැලීම් ආදියෙහි.
To shake &c to strike together.

භූ 59 ඝර-සෙචනම්හි, තෙමීමෙහි හෙවත් වැගිරීමෙහි.
To wet or to drop.

භූ 72 ඝස-අදනසම්ං, කෑමෙහි—To eat.

භූ 76 ඝංස-ඝංසනෙ, ඝර්ෂණයෙහි හෙවත් ඉලීමෙහි.
To shake, to strike together, to rub .

දි 105 ඝා-ගන්ධොපාදනෙ, ගඳගැන්මෙහි හෙවත් ඉඹීමෙහි.
To inhale smell.

භූ 20 ඝුට-ඝොසෙ පතිඝාතෙ, ඝොෂාකිරීමෙහි, නැසීමෙහි.
To cry loudly or to kill.

තු 94 ඝුර-භීමෙ, භයෙහි—To fear. .

භූ 74 ඝුස-සද්දසම්ං, ශබ්දකිරීමෙහි-To cry aloud, to shout.

D

චු 145 ඣුස-සද්දෙ, ශබ්දකිරීමෙහි-To sound loudly.

භූ 4 චක්ඛ-දස්සෙ, දක්මෙහි-To see.

භූ 14 චජ-හානියංදානෙපි, හානියෙහි දීමෙහි.
To abandon, to give.

චු 130 චට-භෙදෙ, බිදීමෙහි—To break.

භූ 24 චඩි-චණ්ඩික්කෙ, චණ්ඩබැවිහි—To be wrathful, fierce.

තූ 88 චන-යාචනෙ, ඉල්වීමෙහි—To beg.

භූ 34 චදි-කන්තිහ්ලාදනෙ, බැබලීමෙහි, සුවවිඳීමෙහි.
To shine, to gladden.

භූ 48 චප-සාන්ත්වෙ, නැලවීමෙහි-To caress, to console.

තූ 91 චප සාන්තවනෙ, නැලවීමෙහි.
To caress, To console.

භූ 50 චබ්බ-අදනෙ, කෑමෙහි-To masticate.

තූ 92 චමු-අදනෙ, කෑමෙහි-To eat.

භූ 60 චර-ගතිභක්ඛණෙසු, යාමෙහි, කෑමෙහි.
To move, To eat.

භූ 62 චල-කම්පනෙ, සැලීමෙහි—To shake.

භූ 57 චාය-සම්පූජනෙ, පිදීමෙහි—To worship.

කී 120 චි-චයෙ, රැස්කිරීමෙහි—To collect.

භූ 4 චික්ඛ-වාචෙ, කීමෙහි—To speak.

භූ 20 චිට-අක්කොසෙ පෙසනෙ, අක්‍රොෂබස්කීමෙහි,
යැවීමෙහි—To censure, to revile, to cause to
go as a messenger.

භූ 21 චිට-උත්තාසෙ, තැතිගැන්මෙහි—To tremble.

භූ 30 චිත-සඤ්ඤාණෙ, සිතීමෙහි-To think or recollect on.

චු 134 චිත-සංචෙතනාදිසු, සිතීම් ආදියෙහි ආදිශබ්දයෙන්
සම්මානනාදිය ගතයුතු.
To recollect, To be sensible or rational &c (to remember)

චු 133 චින්ත-චින්තනෙ, සිතීමෙහි—To think, to recollect.

තූ 95 චිල-වාසෙ, අච්ඡාදනයෙහි.
To put on clothes.

භූ 10 චු-චවනෙ, චුතවීමෙහි.
To pass away from existence, to die.

චු 133 චුණ්ණ-චුණ්ණනෙ, සුණුකිරීමෙහි—To grind into powder.

චු 135 චුද්‍-නුදෙ, දැම්මෙහි (මෙහෙයීමෙහි)
To throw, or to ask, or interrogate.

භූ 45 චුප-මන්‍දගනෙ, ලැසිගමින්හි-To move slowly.

භූ 49 චුම්බ-වදනසංයොගෙ, මුඛයෙන් මුඛයයෙදීමෙහි හෙවත් සිඹිමෙහි—To kiss.

චු 123 චුර-ථෙය්‍ය, සොරකම් කිරීමෙහි-To steal.

භූ 67 චුල්ල-භාවක්‍රියෙ, ශෘඞ්ගාරභාවයෙන් ජාතලිලාවිලාසාදියකිරීමෙහි- To manifest one's meaning, to coquet.

භූ 67 චූල-මද්‍දනෙ, මැඩිමෙහි.
To dally, To wanton, or to rub.

භූ 68 චෙල-සංචලනාදිසු, සැලිම්ආදියෙහි ආදිශබ්දයෙන් ගමන්ගතයුතු—To shake, to go or move.

චු 132 ඡඩ්ඩ-ඡඩ්ඩනෙ, දැම්මෙහි—To throw.

චු 136 ඡද-අපවාරණෙ, වැසීමෙහි—To cover, to close.

චු 136 ඡද්‍ද-වමනෙ, වමනකිරීමෙහි-To vomit.

චු 136 ඡන්‍ද-ඉච්ඡායං, කැමතිවීමෙහි—To wish.

තු 92 ඡමු-නිලනෙ, නින්‍දයෙහි.
To reproach, to abuse.

තු 93 ඡමු-අදනෙ, කෑමෙහි—To eat.

භූ 61 ඡර-ඡෙදෙ, සැපීමෙහි—To cut.

රු 103 ඡිදි-ද්වෙධාකරණෙ, දෙකඩකොට කැපීමෙහි.
To divide, To cut in two.

දි 107 ඡිදි-ද්වෙධාකරණෙ, දෙකඩකොට සැපීමෙහි.
To divide, To cut.

තු 91 ඡුප-ඵස්සෙ, සිපගැන්මෙහි නොහොත් ස්පර්ශකිරීමෙහි—To touch.

තු 92 ඡුභ-නිච්ඡුභෙ, කාරාදැම්මෙහි—To spit out.

භූ 7 ජග්ඝ-හසනෙ, සිනාසීමෙහි - To laugh

භූ 21 ජට-සංඝාතෙ, රැස්කිරීමෙහි—To collect, To clot.

දි 111 ජන-උප්පාදෙ, ඉපදීමෙහි—To be born

භූ 46 ජප-ව්‍යත්තවචෙ, ව්‍යත්කීමෙහි.
To speak, to meditate

භූ 46 ජප්ප-ව්‍යත්තවචෙ, කීමෙහි.
To speak, to meditate, also to whisper,

භූ 51 ජම්භ-ගත්තවිනාමෙ, ශරීරය නැමීමෙහි හෙවත් නැවීමෙහි ලීලායෙහි පැලඹීමෙහි.
To bend the body, to arouse oneself.

තු 92 ජම්භ-ජම්භනෙ, ශරීරය නැමීමෙහි හෙවත් නැවීමෙහි ලීලායෙහි පැලඹීමෙහි—To gape, or yawn.

භූ 59 ජර-ජීරණෙ, දිරීමෙහි–To grow old, to decay.

භූ 62 ජල-දිත්තියං, බැබලීමෙහි–To shine, to blaze.

භූ 61 ජාගර-සුපිනක්ඛයෙ, නිද්‍රාක්ෂයෙහි හෙවත් නොනිදා හිදීමෙහි–To wake, to be awake.

හු 97 ජී-ජයෙ, දිනීමෙහි—To excel, to conquer.

කි 120 ජී-ජයෙ, දිනීමෙහි—To excel, to conquer.

ගු 17 ජී-ජයෙ, දිනීමෙහි—To excel to conquer.

භූ 68 ජීව-පාණධාරණෙ, පණදැරීමෙහි නොහොත් ජීවත්වීමෙහි–To live.

